සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 15 S I

# ඉස්ලාම්

කාලය පැය එකයි

**උපදෙස් :-**
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා ඇති ප්‍රශ්න සඳහා (i),(ii),(iii),(iv) අංක යෙදූ පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.
- මෙම ප්‍රශ්න සඳහා ලකුණු 40 යි.

01. ඉස්ලාමීය අකීදාවේ අන්තර්ගත කරුණක් වන "අස්සම්ඉය්යාත්" යනු,
I අල්ලාහ් පිළිබඳ කරුණු.　　II නබිත්වය පිළිබඳ කරුණු.
III පරලොව පිළිබඳ කරුණු.　　IV මලාඉකාවරුන් පිළිබඳ කරුණු.

02. ඉස්ලාමීය අකීදාවට පාදක වන්නේ,
I කුර්ආන් සහ සුන්නාහ්.　　II කුර්ආන් සහ ඉජ්මා.
III ඉජ්මා සහ කියාස්.　　IV කුර්ආන් සහ උර්ෆ්.

03. හිදායත් යන පදයේ අර්ථය,
I විනාශය　　II ඥාණය.　　III යහගුණාංග.　　IV යහමඟ.

04. නබිවරුන් පවෙන් ආරක්ෂා කරනු ලැබුවන් ය යන්න හඳුන්වන පදය,
I රහ්මත්.　　II ඉස්මත්　　III හිදායත්　　IV මුඃජිසාත්

05. අල්මාඋත් තහුර් යනු,
I අති පිරිසිදු ජලය　　II පිරිසිදු ජලය　　III අපවිත්‍ර ජලය　　IV පරිහරණය කරන ලද ජලය

06. "නියත වශයෙන්ම සලාතය ලැජ්ජාශීලී සහගත දේ හා පිළිකුල් සහගත දේ වලින් වළක්වයි" යනු,
I සහාබිවරයෙකුගේ කියමනකි　　II නබි (සල්) තුමාගේ කියමනකි
III කුර්ආනයේ වැකියකි　　IV ඉමාම් අබූ හනීෆා (රහ්) තුමාගේ කියමනකි

07. කුල්ලතෙන් ජලය යනු,
I ලීටර් 310 කට වඩා වැඩි ජලය　　II ලීටර් 210 කට වඩා වැඩි ජලය
III ලීටර් 240 කට වඩා වැඩි ජලය　　IV ලීටර් 340 කට වඩා වැඩි ජලය

08. සුජුද් සහ රුකූඋ නොමැති සලාතය,
I අවුරුදු සලාතයන්　　II ග්‍රහණ සලාත　　III තස්බීහ් සලාතය　　IV ජනාසා සලාතය

09. ආගමක් සහ සුහුෆ් ලද නබිවරයා,
I මූසා නබි　　II ඊසා නබි　　III මුහම්මද් නබි　　IV ආදම් නබි

10. දුආඋල් ඉෆ්තිතාහ් පාරායණා කරනු ලබන අවස්ථාව,
I මැද හිඳුමේදී　　II රුකූඋවෙහි සිට නැගී සිටි විට
III තක්බීර් තහ්රීම් වලට පසු　　IV අත්තහ්යාතයට පසු

11. නෆ්සුල් මුත්මඉන්නා යනු,
I අයහපතටම පොළඹවන සිත　　II තෘප්තිමත් සිත　　III රෝගී සිත　　IV තමාව රිදවා ගන්නා සිත

12. ඉද්රීස් (අලෛ) තුමාට පිරිනමන ලද සුහුෆ් ගණන,
I 50　　II 40　　III 10　　IV 30

13. තස්කියා යන අරාබි පදයේ තේරුම,
I දේව බිය　　II පරිත්‍යාගශීලී බව　　III පවු සමාව　　IV චිත්ත පාරිශුද්ධය

14. සුහුද් යන පදයේ අර්ථය,
I රැකීම　　II ආදරය දැක්වීම　　III ඇල්මක් නොමැති මෙලොව දිවිය　　IV තෘප්තිමත් බව

15. තර්තීබුන් නුසුල් යනු,
I අල්කුර්ආනය පාරායණය කරන පිළිවෙල　　II අල්කුර්ආනය පහළ වූ පිළිවෙල
III අල්කුර්ආනය ලියන ලද පිළිවෙල　　IV අල්කුර්ආනය ආරක්ෂා කළ පිළිවෙල

16. උස්මාන් (රලි) තුමාගේ පාලන කාලයේ ජනයා කුර්ආනය විවිධාකාරයෙන් පාරායණය කරනු ලබන බවට එම කලීෆාවරයාට දැනුම් දුන්නේ,
I උමර් (රලි) II හුදෛබතුල් යමානි (රලි) III අබුබක්කර් (රලි) IV අලි (රලි)

17. තයම්මුම්හි අවයව මොනවාද?
I මුහුණ සහ දෙඅත් II මුහුණ සහ දෙපා III මුහුණ සහ හිස IV මුහුණ, හිස, දෙඅත්

18. කියාස් හි අර්කාන් වලින් අල්ෆරඋ යනු කුමක්ද?
I පොදු ගුණාංග II විසඳුම III නව ගැටළුව IV විසඳුම් දෙන ලද ගැටළුව

19. උර්ෆ් යන පදයේ සිංහල තේරුම,
I සමාජ සුභ සෙත II සිරිත්
III ඒකමතික තීරණය IV සහාබිවරයෙකුගේ කියමන

20. හදීස් වැඩි වශයෙන් දැනුම් දුන් නබි මිතුරා,
I තල්හා (රලි) II අනස් (රලි) III උමර් (රලි) IV අබූ හුරෛරා (රලි)

21. මුහාසබා යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
I දේව තෘප්තිය II ඉවසීම III ස්වයං ඇගයීම IV චිත්ත පාරිශුද්ධය

22. මුහද්දිස් යනු,
I හදීස් කලාවේ වියතුන් II කුර්ආන් විග්‍රහ කරන්නන්
III නීති කලාවේ විශාරදයින් IV අකීදා කලාවේ විශාරදයින්

23. මක්කා ජයග්‍රහණය සිදු වූ වර්ෂය,
I හිජ්රි 8 II හිජ්රි 10 III හිජ්රි 5 IV හිජ්රි 7

24. මදීනාවේ පැරණි නම,
I බක්කා II යෙමන් III තායිෆ් IV යත්රිබ්

25. නබි (සල්) තුමාගේ ජීවිත ඉතිහාසය ප්‍රථමයෙන් ලියුවේ,
I ඉබ්නු කල්දූන් II ඉබ්නු ඉස්හාක් III ඉබ්නු හිෂාම් IV ඉබ්නු හල්ලිකාන්

26. උමර් (රලි) උස්මාන් (රලි) පාලන කාලයේ කුර්ආනය එක්රැස් කිරීමේ කාර්යයට නායකත්වය දැරුවේ,
I අලි (රලි) II තල්හා (රලි) III සෙයිද් ඉබ්නු සාබිත් (රලි) IV සෙයිද් ඉබ්නු මුස්හෆ් (රලි)

27. පහත සඳහන් අය අතුරින් අජ්නබි වනුයේ,
I පුතාගේ බිරිඳ II නැන්දාගේ පුතා III කිරි මව IV බිරිඳගේ මව

28. මුස්ලිම්වරයෙකු ඉටු කළයුතු වගකීම් අතුරින් "ඉමාරත්" වගකීම යනු,
I භූමිය සශ්‍රීක කිරීම II අල්ලාහ්ගේ නියෝජිතයා ලෙස සිටීම
III අල්ලාහ් නැමදීම IV දෙවියන්ගේ අණට කීකරුව ක්‍රියා කිරීම

29. ජනාසා සලාතයේ තුන්වන තක්බීරයට පසු පාරායණය කළ යුත්තේ,
I සූරා ෆාතිහා II සලාම් පැවසීම
III නබිතුමා කෙරෙහි සලවාත් කීම IV ජනාසාව වෙනුවෙන් දුආ ප්‍රාර්ථනා කිරීම

30. නබි (සල්) තුමා මක්කාවේ ජීවත් වූ කාලය,
I වසර 40 II වසර 53 III වසර 63 IV වසර 13

31. ස්පාඤ්ඤය ජය ගත්තේ කවුද?
I මුහම්මද් බින් කාසිම් II මුහම්මද් අල්ෆාතිහ් III තාරික් බින්සියාද් IV උමර් (රලි)

32. නබි (සල්) තුමා "අල් අමීන්" යනුවෙන් හැඳින්වීම සඳහා වූ හේතුව,
I සත්‍ය කථා කිරීම II විශ්වාසවන්තභාවය නිසා
III අනාථයෙකු වශයෙන් හැදීවැඩීම IV සමාජ සේවය සිදු කිරීම

33. "උම්මතන් වසතන්" හි අර්ථය,
I පරිත්‍යාගශීලී බව II මධ්‍යස්ථ සමූහය III නිහඬව සිටීම IV නබිතුමාගේ සමූහය

34. ෆර්ළු අයින් යනු,
I සමාජයේ එක් කොටසක් හෝ විසින් ඉටු කළ යුතු
II මුස්ලිම්වරුන් කණ්ඩායම් වශයෙන් ඉටු කළ යුතු
III තනි තනිව කැමති ආකාරයට ඉටු කළ යුතු
IV සෑම මුස්ලිම්වරයෙකුටම අනිවාර්යයෙන් ඉටු කළ යුතු

35. ඉමාම් අහමද් ඉබ්නු හන්බල් (රහ්) අබූ මන්සූර් අල් මාදුරුදි (රහ්) යන දෙදෙනා,
I තෆ්සීර් කලාවේ විශාරදයන් II නීතී කලාවේ විශාරදයන්
III අකීදා කලාවේ විශාරදයන් IV හදීස් කලාවේ විශාරදයන්

36. සලාතයේ ෆර්ලු වලට අයත් නොවන්නේ,
I සලාතය ඉටු කරනු ලබන ස්ථානය පිරිසිදුව තිබීම
II සූරා ෆාතිහා පාරායණය
III පළමු තක්බීරය කීම
IV සුජුද් කිරීම

37. අල්කුර්ආනයේ ඇති දීර්ඝතම සූරාව,
I ආල ඉම්රාන්
II අල් බකරා
III අල් මුල්ක්
IV මාඉදා

38. නබි (සල්) තුමා අවසන් හජ් ඉටු කළ වර්ෂය,
I හිජ්රි 8
II හිජ්රි 6
III හිජ්රි 10
IV හිජ්රි 9

39. ජම්උ තක්දීම් යනු,
I එකට එකතු කර සලාතය ඉටු කිරීම
II පසුව එකට එකතු කිරීම
III කෙටි කර සලාතය ඉටු කිරීම
IV පෙරටු කර එකට එකතු කිරීම

40. ජබීරත් යනු,
I තුවාලයට දමනු ලබන වෙළුම
II වරදට පිළියම
III මුහුණ වැසීමට භාවිතා කරනු ලබන ආවරණය
IV පිරිසිදු වැලි

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.** **(කාලය පැය දෙකයි)**

01. කෙටි පිළිතුරු ලියන්න.
i. නජිස් වර්ග දෙකක නම් ලියන්න.
ii. වහී හි වර්ග දෙක කුමක්ද?
iii. ඉජ්මා හි ප්‍රධාන කොටස් දෙක කුමක්ද?
iv. ඊමානයේ කොටස් දෙක කුමක්ද?
v. අල්කුර්ආනයේ දීර්ඝ සූරාවන් දෙකක නම් ලියන්න.
vi. රාත්‍රී කාලයේ ඉටු කළ යුතු සුන්නත් සලාත් දෙකක නම් ලියන්න.
vii. සලාතයේ ෆර්ළු හතරක් ලියන්න.
viii. ඉජ්මා හි තීරණය පිළිගෙන ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.
ix. ඉස්ලාමීය දෘෂ්ටිකෝණයෙන් ආදරය දැක්වීම සඳහා වන කොටස් දෙක කුමක්ද?
x. අල්මාඋත් තාහිර් සඳහා උදාහරණ දෙකක් ලියන්න.

02. i. අකීදාවේ පවිත්‍රත්වය ආරක්ෂා කිරීමට වෙහෙස වූ ඉමාම්වරු දෙදෙනෙකුගේ නම් ලියන්න.
ii. ඉස්ලාමීය අකීදා කණ්ඩායම් බිහිවීමට බලපෑ කාරණා ලියන්න.
iii. සලාතයේ ප්‍රයෝජන පහක් ලියන්න.

03. i. තස්කියතුන් නෆ්ස් යනු කුමක්දැයි කෙටියෙන් පහදන්න.
ii. පවු සමාව සඳහා වන කොන්දේසි ලියන්න.
iii මිනිසාගේ එදිනෙදා ක්‍රියාකාරකම් ඉබාදත් වීමට අවශ්‍ය කොන්දේසි ලියන්න.

04. i. හදීස් යන පදයෙහි ඉස්ලාමීය පාරිභාෂික අර්ථය ලියන්න.
ii. ජාහිලියා කාලයේ විසූ ජනයාගේ දක්නට ලැබූ යහගුණාංග ලියන්න.
iii. ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ වැදගත් කරුණු මොනවාද?

05. i. අජ්නබි, මහ්රම් අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.
ii. ඉපැයීමේ වැදගත්කම් තුනක් ලියන්න
iii. ඉස්ලාම් ලබා දී ඇති මිනිස් අයිතිවාසිකම් පහක් ලියන්න.

06. i. ව්‍යාපාරයෙහි මූලික කරුණු ලියන්න.
ii. ව්‍යාපාර ගනුදෙනු වලදී තහනම් කළ දේවල් හයක් ලියන්න.
iii. නබි (සල්) තුමාගේ තවුබාව වැලැක්වීමට කුරෙෂිවරුන් විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග මොනවාද?

07. පහත සඳහන් මාතෘකා අතුරින් මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
i. අල්කුර්ආනය ගොනු කිරීම.
ii. ෆික්හුල් අව්ලවිය්යාත්.
iii. අල් ඉජ්මාඋ.
iv. අල් වරඋ.